(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 128.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2011 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0285/'10

1.

ගරු රවි කරුණානායක මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා කවරේද;

(ii) ඉහත කී අමාත්‍යාංශයේ සමස්ත මාසික සහ වාර්ෂික පිරිවැය කොපමණද;

(iii) ස්ථිර කාර්ය මණ්ඩල සේවක සංඛ්‍යාව සහ ඔවුන්ට මාසිකව ගෙවනු ලබන සමස්ත වැටුප් සහ දීමනා ප්‍රමාණය කොපමණද; සහ

(iv) ජල සම්පාදන සහ ජලාපවහන අමාත්‍යතුමාගේ, නියෝජ්‍ය අමාත්‍යතුමාගේ සහ එම කාර්ය මණ්ඩලවල සමස්ත මාසික පිරිවැය කොපමණද;

යන්න 2010 සහ 2011 වර්ෂවලට අදාළව, වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0756/'10

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වන විට ගුරු වෘත්තියේ නියැළී සිටින, අධ්‍යාපන විද්‍යාපීඨවලින් පිටවූ ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් අතරින් ශාස්ත්‍රවේදී උපාධි, විද්‍යාවේදී උපාධි, පශ්චාත් උපාධි, ශාස්ත්‍රපති උපාධි ආදී උපාධි තලයන් දක්වා උසස් අධ්‍යාපනය ලබා ඇති සංඛ්‍යාව කොපමණද;

(iii) ලබා ඇති එම උපාධි අනුව ගුරු සේවයේ ඒ ඒ ශ්‍රේණිවලට ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් පත්කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) සබරගමුව පළාත් සභාවේ සේවය කරන ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරී ගුරුවරුන් උපාධි ලබා තිබේ නම්, ඔවුන්ගේ පත්වීම් උපාධිධාරී ගුරු පත්වීම් ලෙස සලකා ගුරු සේවයේ අදාළ ශ්‍රේණිවල පිහිටුවීම සඳහා චක්‍ර ලේඛයක් එම පළාත් සභාව විසින් නිකුත්කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) අනෙකුත් ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් ලබාගත් උපාධි අනුව ගුරු සේවය තුළ උසස්වීම් ලබාදීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0842/'10

3.

ගරු දයාසිරි ජයසේකර මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2010 එක්සත් ජාතීන්ගේ සමුළුව සඳහා සහභාගි වූ ජනාධිපතිවරයා ඇතුළු කණ්ඩායමේ සිටි සාමාජිකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමුළුව සඳහා එක් රටකට ලැබෙන නිල අවසර පත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම කණ්ඩායම නවාතැන් ගත් ස්ථානයේ නම කුමක්ද;

(iv) එම සංචාරය වෙනුවෙන් වියදම් වූ මුළු මුදල කොපමණද;

(v) එම වියදම දරනු ලබන අය කවුරුන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සමුළුවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික අනෙකුත් රටවල්වලින් ඉදිරිපත් කළ නියෝජිත සංඛ්‍යාව එක් එක් රට අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද; යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1245/'11

4.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය වැය කළ මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍යාංශයේ එක් එක් ආයතනය හා දෙපාර්තමේන්තුව මගින් එම ප්‍රදර්ශනය සඳහා කළ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තු හා ආයතන විසින් ඉටු කරන ලද කර්තව්‍යයන් කවරේද;

(iii) එම එක් එක් කාර්ය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසු ගිය අය - වැයෙන් ඉහත වියදම් සඳහා මුදල් වෙන් කරන ලද අමාත්‍යාංශ වැය ශීර්ෂය කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1298/'11

5.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, දෙමදොය ග්‍රාමීය ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා ඇති බවත්;

(ii) එම ජල ව්‍යාපෘතිය නවතා දැමීම නිසා ප්‍රදේශයේ පවුල් දෙදහසක් පමණ උග්‍ර පානීය ජල ප්‍රශ්නයකට මුහුණ පා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ග්‍රාමීය ජල ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) ජල ව්‍යාපෘතියේ වැඩ කටයුතු කඩිනමින් ආරම්භකර ප්‍රදේශයේ ජනතාවගේ ජල අවශ්‍යතා ඉටු කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0475/'10

6\.

ගරු රවී කරුණානායක මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2006 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය පවත්වන ලද දිනය කවරේද;

(ii) එක්සත් ජාතික පක්ෂය විසින් සහ ජනතා විමුක්ති පෙරමුණ විසින් ජයග්‍රහණය කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නිල කාලය නිමවීමට පෙර අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(iv) එසේ විසුරුවා හරින ලද පළාත් පාලන ආයතන කවරේද;

(v) ඒවා අත්හිටුවන ලද හෝ විසුරුවා හරින ලද දිනයන් සහ එසේ කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (ii) හි සඳහන් සභා අතරින් නගරාධිපතිවරුන් ධුරයෙන් ඉවත් කරන ලද, ඔවුන්ගේ තනතුරු අත්හිටුවන ලද හෝ ඔවුන් තනතුරෙන් පහ කරන ලද, එසේත් නැති නම්, ඔවුන් විමර්ශනයට භාජනය කරන ලද පළාත් පාලන ආයතනවල නම් කවරේද;

(ii) එම සිදුවීම්වලට අදාළ දිනයන් සහ එබඳු ක්‍රියාමාර්ග ගැනීමට හේතු කවරේද;

(iii) මේ වන විට ඔවුන් සම්බන්ධයෙන් එළඹී ඇති නිගමනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1023/'10

7\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ උද්ධමනය ගණනය කිරීමට යොදාගන්නා වත්මන් ක්‍රමවේදය සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උද්ධමනය පාලනය කිරීමට වර්තමානයේ රජය විසින් ගනු ලබන පියවර කවරේද;

(ii) එම පියවර මගින් ප්‍රමාණවත් අන්දමින් උද්ධමනය පාලනය වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1299/'11

8.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීට වර්ෂ පහකට පමණ පෙර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති මාතලේ දිස්ත්‍රික්කයේ, පල්ලෙපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පල්ලෙපොළ මන්නවත්ත හන්දියේ සිට ගොඩවෙලලන්ද දක්වා මාර්ගයේ ඇති පාලමේ ඉදිකිරීම් කටයුතු මේ දක්වා අවසන් වී නොමැති බවත්;

(ii) එම හේතුවෙන් ජනතාව මහත් දුෂ්කරතාවකට මුහුණපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) මුදල් වෙන්කර තිබියදීත් ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාලමේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට කඩිනමින් කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1314/'11

9.

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව තුළ සේවය කරනු ලබන ස්ථිර හා අනියම් සිවිල් සේවකයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සේවකයින්ට එක් මාසයක් තුළ අතිකාල දීමනා ලෙස ගෙවනු ලබන මුදල කොපමණද;

(iii) 2011 ජනවාරි මස සිට මේ දක්වා එම සේවකයින් වෙනුවෙන් නියමිත පරිදි අතිකාල දීමනා ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(v) 2011 ජනවාරි සිට මෙතෙක් ගෙවා නොමැති අතිකාල දීමනා ගෙවනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1626/'11

10.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 මැයි මාසයේ සිට මේ දක්වා ප්‍රවාහන අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුනු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදුකළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගී වූ නිලධාරීන්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්යමණ්ඩලයේ නිලධාරීන් කවුරුන්ද;

(v) එම සහභාගීවූවන් එක් එක් සංචාරය සඳහා ගමන්ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0586/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නිදහස ලබාගත් දා සිට මේ දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකා රජය වෙනත් රටවලට ඉඩම් තෑගි ලෙස ලබාදී තිබේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම්වල ප්‍රමාණය පර්චස් හෝ අක්කර කොපමණද;

(iii) එසේ ඉඩම් ලබා දීමේ අරමුණ කවරේද;

(iv) එසේ මෙරට ඉඩම් ලබා දුන් රටවලින් ඒ අයුරින්ම තෑගි ලෙස ඉඩම් ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

(v) එසේ නම්, එම ඉඩම් ලබා දුන් රටවල නම්, ඒවා ලබා දුන් දිනයන් සහ එසේ ලැබුණු ඉඩම්වල ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1026/'10

12.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2008, 2009 සහ 2010 යන වර්ෂවලදී ශ්‍රී ලංකාවට විදේශ ආයෝජන ලෙස ලැබුණු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් වර්ෂයේදී ප්‍රමාණවත් විදේශ ආයෝජන ශ්‍රී ලංකාවට ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1300/'11

13.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ, ඇල්පිටිය අධ්‍යාපන කලාපයට අයත් ගා/පිටිගල මහා විද්‍යාලය මීට වර්ෂ 8කට පමණ පෙර අංග සම්පූර්ණ මහා විද්‍යාලයක් ලෙස ප්‍රචලිතව පැවති බවත්;

(ii) වර්ෂ කිහිපයකට පෙර මෙම පාසල වසා දැමීම නිසා ඊට අයත් ගොඩනැගිලි දහයක් පමණ මේ වන විට විනාශ වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාර්ග පහසුකම් සහිත ප්‍රදේශයක පවතින මෙම වටිනා සම්පත නැවත පාසලක් ලෙස වැඩි දියුණු කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගතවන කාලය කොපමණද;

(iii) පාසල නැවත විවෘත කිරීමට කටයුතු නොකරන්නේ නම්, වෙනත් ඵලදායී කටයුත්තක් සඳහා එම ගොඩනැගිලි හා අනෙකුත් සම්පත් යොදා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම ගොඩනැගිලි භාවිතා කිරීමට අපේක්ෂිත කාර්යය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1315/'11

14\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාලු මුවදොර පිහිටි ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය ඉවත් කර, එය පිහිටි ඉඩම විදේශීය සමාගමක් වෙත විකුණා දැමීමට හෝ බදු දීමට කටයුතු කර තිබේද;

(ii) බදු පදනම මත ලබා දී ඇත්නම්, එසේ ලබා දී ඇති කාල සීමාව කොපමණද;

(iii) එම ඉඩම ලබා දී ඇති විදේශීය සමාගමෙහි නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ඉඩම ලබා දීමට අදාළ ගිවිසුම එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ ) නොඑසේ නම්, ඒ මන්ද?

1627/'11

15\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 දෙසැම්බර් මාසයේ සිට මේ දක්වා විදේශ කටයුතු අමාත්‍යවරයා / නියෝජ්‍ය අමාත්‍යවරයා යෙදුනු විදෙස් සංචාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංචාර සිදුකළ රටවල් කවරේද;

(iii) එම එක් එක් විදෙස් සංචාරයේ අරමුණු හා ලබා ගන්නා ලද ප්‍රතිඵල කවරේද;

(iv) එක් එක් සංචාරය සඳහා සහභාගී වූ නිලධාරීන්, මාධ්‍යවේදීන් හා පුද්ගලික කාර්යමණ්ඩලයේ නිලධාරීන් කවුරුන්ද;

(v) එම සහභාගීවූවන් එක් එක් සංචාරය සඳහා ගමන්ගත් ගුවන් යානයේ පන්තිය හා ඒ සඳහා වැය කළ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම සංචාරයන් සඳහා වියදම් වූ මුළු මුදල කොපමණද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## ශෝක ප්‍රකාශ යෝජනා

1\.

අභාවප්‍රාප්ත ගරු එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2\.

අභාවප්‍රාප්ත ගරු එච්. ජී. පී. නෙල්සන් මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

3\.

අභාවප්‍රාප්ත ගරු මර්වින් ජේ. කුරේ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන (2012),— 2012 මුදල් වර්ෂයේ සේවා වියදම් සඳහා විධිවිධාන සැලසීම සඳහා ද; ඒ සේවා කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැර හෝ ණය ලබා ගැනීමට බලය දීම සඳහා ද; ඒ මුදල් වර්ෂය තුළ ආණ්ඩුවේ ඇතැම් කටයුතු වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම සඳහා ද; එම කටයුතු වෙනුවෙන් ඒ මුදල් වර්ෂය තුළ වියදම් සඳහා අවශ්‍ය වන මුදල් ඒකාබද්ධ අරමුදලින් හෝ ආණ්ඩුවේ හෝ ආණ්ඩුවට සුදුස්සක් කළ හැකි වෙනත් යම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීම සඳහා ද; ඒකාබද්ධ අරමුදලට ඒ මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ ඉහත කී කරුණු හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලසීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන),— 2008 අංක 5 දරන රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

## යෝජනා පිළිබඳ දැනුම්දීම

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 6.30 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

4.

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මිනුවන්ගොඩ සිංහ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

5.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රජා ඖෂධවේදීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

6.

ගරු රුවන් රණතුංග මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 3),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

7.

ගරු තිලංග සුමතිපාල මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 4),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"මෙත් සේවා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

8.

ගරු තිලංග සුමතිපාල මහතා මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 5),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සිත් සෙවන මන්ද මානසික ළමා සංවර්ධන සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත,— දෙවැනි වර කියවීම.

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 22(1) (අ) වැනි වගන්තිය යටතේ, ස්වභාවය වෙනස් නොකරන ලද නොහොත් පානීය, විකිණීම සඳහා බෝතල් ගතකරන ලද මත්පැන් අපනයනය කිරීම සඳහා අවසර දීම සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් පනවන ලදුව, 2011 ජුනි 21 දිනැති අංක 1711/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 937 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියෝගය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, (52 වැනි අධිකාරිය වන) සුරාබදු ආඥාපනතේ 22(1) වැනි වගන්තිය යටතේ, දේශීය ඖෂධ නිෂ්පාදනය හා වෙනත් අනුමත කර්මාන්ත හා කාර්යයන් සඳහා යොදා ගනු ලබන ඊතයිල් මධ්‍යසාර මත බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් පනවන ලදුව, 2011 ජුනි 21 දිනැති අංක 1711/9 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.10.06 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අංක 938 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 1),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජුලි 11 දිනැති අංක 1714/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 2),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජුලි 11 දිනැති අංක 1714/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 3),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා,— ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ නියමය (අංක 4),— 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 වැනි වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 අගෝස්තු 12 දිනැති අංක 1718/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.09.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ගොවිජන සංවර්ධන (සංශෝධන)පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

නොතාරිස් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව

*15.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව

*16.

සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*17.

විදේශ සේවානියුක්තයන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ අරමුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

විශ්‍රාම වැටුප් (ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*19.

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.06.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2008,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2010.09.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහාරෝහලශාලාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතුය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2008,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.12.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික හා තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*23.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව 2008,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරි පනතේ 34 වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය අනුව 2010.06.30 වැනි දින ඉදිරිපත් කරන ලද, 2008.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතුය.

(විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් සලකා බලන ලදී.)

*24.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 5 ආ සහ 5 ඇ වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 25 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලද සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් අනුමත කරන ලදුව 2010 ඔක්තෝබර් මස 27 දිනැති, අංක 1677/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.01.04 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*25.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක

1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."

යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

28.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

බලන බුද්ධ ප්‍රතිමා නිර්මාණ සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

30.

ශ්‍රී ධම්මාලංකාර සමාජ සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

රාමක්‍රිෂ්ණ සාරදා දූත මෙහෙවර (ලංකා ශාඛාව) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

දෙහිවල, නැදිමාලේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**